# බලන්ගොඩ නගර සභාව
# කර්මාන්ත කමිටු වාර්තාව

දිනය-2010.08.18 වේලාව- පෙ.ව. 10.30

පැමිණීම

| නම | තනතුර | ආයතනය |
|---|---|---|
| 01.ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා | සභාපති | බලන්ගොඩ නගර සභාව |
| 02.ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා | නාගරික මන්ත්‍රී | බලන්ගොඩ නගර සභාව |
| 03.ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා | නාගරික මන්ත්‍රී | බලන්ගොඩ නගර සභාව |
| 02.ආර්.ඩී.නලින් පුෂ්පකුමාර මහතා | ලේකම් | බලන්ගොඩ නගර සභාව |
| 05.එම්.ඩී.එස්.ප්‍රනාන්දු මහතා | ගණකාධිකාරී | බලන්ගොඩ නගර සභාව |
| 07.යූ.වී.දැල බණ්ඩාර මහතා | වැඩ අධිකාරී | බලන්ගොඩ නගර සභාව |
| 09.ඩී.කේ.පී.රංජනී මිය | වැඩසටහන් සහකාර | බලන්ගොඩ නගර සභාව |

ගරු සභාපතිතුමා විසින් පැමිණිසිටි සියළු දෙනා පිළිගනිමින් සාකච්ඡාව ආරම්භ කරන ලදී.

මෙහිදී පහත සඳහන් පරිදි යෝජනා හා තීරණ ගන්නා ලදී.

- අනතුරුදායක ගස් ඉවත් කිරීමට නියෝග ලබාදීමෙන් පසු ගත් ක්‍රියා මාර්ග වැඩ අධිකාරීගෙන් විමසන ලදී.පළමු හා දෙවන වර දැනුම් දීම් සිදු කර ඇති බව වැඩ අධිකාරී විසින් දැන්වීය.නියෝගය ක්‍රියාත්මක කර නොමැති ස්ථාන වල ගස් කපන්නන්ගෙන් මිල ගණන් කැඳවා සභාවෙන් ඉවත් කර එම ගස් වෙන්දේසි කර අලාභය පියවා ගැනීමට නොහැකිනම් නීත්‍යානුකුලව කටයුතු කර අදාල අලාභය අයකර ගැනීමට කටයුතු කරන ලෙස දැන්වීය.අනතුරුදායක ගස් පරීක්ෂා කිරීමේ දී මිනිස් ජීවිත හා දේපල වලට හානියක් නොවේ නම් ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කරවීමටත් පරීක්ෂා කර වාර්තා සැපයීමේ දී ගස් හා නිවෙස් වලට හා මහා මාර්ග වලට පවතින දුර ප්‍රමාණයන් සහිතව දළ රූප සටහනක් ඇතුලත් කර වාර්තාව ඉදිරිපත් කරන ලෙසත් දැන්වීය.
- සෑම සභා වාර්තාවකටම එම මාසයේ ස්ථිර හා තාවකාලික කම්කරුවන් යොදා නඩත්තු සිදුකළ මාර්ග මොනවාද යන්නට වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස දැන්වීය.
- වාහන හා මුරකරුවන් පරීක්ෂා කිරීමට කටයුතු කරන ලෙස ද සැලසුම් කමිටුව නියමිත දිනට පැවැත්වීමටත් සැලසුම් නිර්මාණ ශිල්පීන් කැඳවා දැණුවත් කිරීම සිදු කරන ලෙස දැන්වූ අතර මෙතෙක් එය ඉටුනොවූ බැවින් එය ක්‍රියාවට නංවන ලෙස වැඩ අධිකාරී වෙත දැණුම් දෙන ලදී.
- බුලත්ගම දෙමළ විද්‍යාල පාරෙහි ගොඩනැගිලි සුන්බුන් මාර්ගයේ යොදා ඇති අතර එය පරීක්ෂා කර ඉවත් කරවීමට දැණුම් දීමට තීරණය විය.
- කරව්කැටිය මහමෙව්නා පාරේ දකුණු පස අතුරු මාර්ගය උඩකන්දට සම්බන්ධ වන මාර්ග කොටසේ කුණු දැමීමට ස්ථානයක් නොමැති බවටත් කුණු ඉවත් කර ගැනීමට වාහනයක් යාමට හැකියාවක් ද නොමැති බවටත් හා එම මාර්ග කොටස සකස් කර දෙන ලෙසටත් ගම්වැසියන් විසින් කරන ලද ඉල්ලීම සලකා බලා කරව්කැටිය පාරේ විජේකෝන් මහත්මියගේ නිවෙසේ දී අදාල ගම් වැසියන් සමග සාකච්ඡාවක් පැවැත්වීමට තීරණය විය.
- නගරයේ රථ වාහන ගමනාගමනය වන ආකාරය පිළිබඳව ගැටළු පවතින බැවින් රථ වාහන පොලීසිය,ත්‍රීරෝද රථ සංගම්,වෙළඳ සංගම්,මාර්ග සංවර්ධන අධිකාරිය,නාගරික සංවර්ධන අධිකාරිය,නගරයේ පාසල් වල විදුහල්පතිවරුන්,කාර්යාලවල ප්‍රධානීන්,බළන්ගොඩ ඩිපෝව,මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය සම්බන්ධ කරගෙන ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීගේ සහභාගීත්වයෙන් සාකච්ඡාවක් පැවැත්වීමට දිනයක් ලබාගෙන රැස්වීමක් කැඳවීමට කටයුතු කළයුතු බවට තිරණය විය.

- මග නැගුම ව්‍යාපෘතිය සඳහා සපයන ලද අන්තර් සවි කොන්ක්‍රීට් කුට්ටි ගල් සඳහා අවශ්‍ය මුදල් දැනුම් දීම සම්බන්ධව ඇම්ට්‍රැඩ් ආයතනයෙන් යොමු කරන ලද 2010.08.13 දිනැති ලිපිය සලකා බලා සියළු මුදල් ඉදිරියේ දී ගෙවීමට ඇති බිල්පත් වලින් අයකරගෙන ඇම්ට්‍රැඩ් ආයතනය වෙත යැවීමට තීරණය විය.
- මග නැගුම ව්‍යාපෘතිය යටතේ මුදල් වෙන් වී ඇති හුණුකුඹුර 2 අදියර සඳහා හුණුකුඹුර කෝපිවත්ත මාර්ගයට සම්බන්ධ පාර කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම රු.526,029.52 ඇස්තමේන්තුව අනුමත කරන ලදී.මෙම මාර්ග කොටස ඉදිකිරීම සිදු කරන බවට මහා මාර්ග අමාත්‍යාංශය වෙත දැණුම් දීමට තීරණය කරන ලද අතර සභාව මගින් සෘජු ශ්‍රමයෙන් ඉටුකිරීමටත් තිරණය කරන ලදී.
- හුණුකුඹුර කොපිවත්ත මාර්ගයට සම්බන්ධ පාර බැමි බඳීම ඇස්තමේන්තුව- රු.268,465.93. මෙම කර්මාන්තය සභාවෙන් සෘජු ශ්‍රමයෙන් ඉටු කිරීමට තීරණය විය.

  01.උඩකන්ද ගල්වල මාර්ගය කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීමට හැකිවන අයුරින් කාණුව සඳහා බැම්ම බැඳීම. රු.245162.07 ක ඇස්තමේන්තුව

  02.උඩකන්ද ගල්වල මාර්ගය කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම- රු.523,172.64 ක ඇස්තමේන්තුව

ඉහත ඇස්තමේන්තු 02 අනුමත කරන ලද අතර 01 සභා අරමුදල් මගින් ද 02 මගනැගුම අරමුදල් මගින් ද ඉටුකිරීමට තීරණය කළ අතර මෙම කර්මාන්ත දෙක වතුකාරගොඩ සමෘද්ධි සමිතිය වෙත ලබා දී ඉටුකිරීමටත් තීරණය කරන ලදී.

- සුදර්ශනපුර ඉහල නිවාස වලට යන මාර්ගය අවසාන කොටස සංවර්ධනය කිරීම. රු.496,353.68 ඇස්තමේන්තුව 2010.06.23 දින සභාව අනුමත කරන ලද අතර එය සෘජු ශ්‍රමයෙන් ඉටුකිරීමට තීරණය කරන ලදී.

ආර්.ඩී.නලින් පුෂ්පකුමාර,
ලේකම්,
බළන්ගොඩ නගර සභාව.